සියලුම ග්‍රාම නිලධාරීන් / ගණන් ගැනීමේ නිලධාරීන් වෙත,

**ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2021**

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇඳිරි නීතිය හා සංචරණ සීමා පැනවීම සහ රජයේ කාර්යාල වැඩ කරන දින සීමා කිරීම්වලට යටත්ව 2020 වර්ෂයේ ඡන්ද හිමි නාමලේඛනය සහතික කිරීම දක්වා කාර්යයන් නිලධාරීන්ගේ දැඩි කැපවීම හමුවේ අවසන් කිරීමට හැකිවිය. කොවිඩ් 19 වසංගතය වරින් වර මතුවන තත්ත්වයක් මත ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය මින් පෙර වසර වලදී සිදු කළ අයුරින් ගෙයින් ගෙට ගොස් බී. සී. ආකෘති ගණන් ගැනීමේ නිලධාරීන් විසින් භාර දීම හා ආපසු භාර ගැනීම නොකිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත.

02. ප්‍රවර්ථන නාමලේඛනයෙන් ඉවත් වීමට නියමිත ඡන්ද හිමියන් හා ඇතුළත් වීමට නියමිත ඡන්ද හිමියන් පිළිබඳ තොරතුරු ලබා ගැනීම මඟින් "අ" සහ "ආ" ලැයිස්තු සකස් කිරීමත් කෙටුම්පත් අවස්ථා කිහිපයක් මඟින් දත්ත යාවත්කාලීන කිරීම මෙන්ම දත්ත යාවත්කාලීන කිරීමට අදාළ තොරතුරු විවිධ රාජ්‍ය ආයතන මඟින් ලබා ගැනීම තුළින් ප්‍රතිශෝධන කාර්යයන් ඉටු කර 2021 නොවැම්බර් මස 30 දින නාමලේඛනය සහතික කිරීමටත් මැතිවරණ කොමිෂන් සභාව සැලසුම් කර ඇත.

03. 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(1) වගන්තියට අනුව 2021 වසරේ ඡන්ද හිමියන් ගණන් ගැනීම 2021 ජූනි මස 01 වන දින ආරම්භ කරන බව 2021.06.01 දිනැතිව අති විශේෂ ගැසට් නිවේදනයක් පළ කර ඇති අතර 2021 වර්ෂයේ ජූනි මස 01 දින ඡන්ද හිමියන්ගේ සුදුසුකම් ලැබීමේ දිනය ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

## 04. 2021/ ER ආකෘතිය බෙදාහැරීම හා එකතු කර ගැනීම.

4.1 2021 වර්ෂය සඳහා ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයේ දී ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා විශේෂ ආකෘති පත්‍රයක් හඳුන්වා දී ඇති අතර ඒ ආකෘති පත්‍රය 2021/ ER ලෙස හැඳින්වේ. එම ආකෘතිය හා එයට අමුණා ඇති විශේෂ උපදෙස් පත්‍රිකාව මහජනතාව ඉල්ලා සිටින අවස්ථාවලදී ලබා දීමට ක්‍රියා කළ යුතුය.

4.2 2021/ ER ආකෘතිය මීට පෙර වසමේ A හා B නම් ගණන සැලකිල්ලට ගෙන දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල විසින් ගණන් ගැනීමේ නිලධාරීන් වෙත ලබා දෙනු ඇත. මහජනයා විසින් ඉල්ලා සිටින අවස්ථාවලදී ආකෘති පත්‍ර නිකුත් කළ යුතු අතර, දුරකථන ඇමතුම් මගින් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයකින් ER ආකෘති ඉල්ලා සිටින විට අදාළ ගෘහය වෙත එය ලැබීමට සැලැස්විය යුතුය. එමෙන්ම වසමට/ ඡන්ද කොට්ඨාසයට අළුතින් පදිංචියට පැමිණි තැනැත්තන් පිළිබඳව සොයා බලා ඔවුන් වෙත ER ආකෘතිය ලබාදීමට පියවර ගත යුතු වේ.

4.3 මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවිය ඔස්සේ මෙම ආකෘතිය භාගත කිරීමේ පහසුකම් සලසා ඇති අතර එලෙස භාගත කර සම්පූර්ණ කර ඔබ වෙත ලබා දෙන ER ආකෘති ද අදාළ පුද්ගලයන්ගේ සාමාන්‍ය පදිංචිය නියමිත දිනට සනාථ වේ නම් එම තැනැත්තන්ගේ නම් ගණන් ගැනීමට කටයුතු කරන්න.

## 05. ඡන්ද හිමියන්ගේ සුදුසුකම්

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 9(3) වගන්තිය යටතේ ඡන්ද ප්‍රදේශවල දැනට වලංගුව පවතින ඡන්ද කොට්ඨාසවලට අයත් ගම් ප්‍රදේශ / වීථි නිවැරදිව හඳුනාගෙන ඒවා යටතේ ඡන්ද හිමියන් ගණන් ගෙන, ප්‍රතිශෝධන කටයුතු ගණන් ගන්නා නිලධාරීන් විසින් අවසන් කළ යුතුය. **“පළාත් පාලන ආයතනයක් විසින් ගැසට් නිවේදනයක් මඟින් ප්‍රසිද්ධ කරන ලද පාර / වීථි 9(3) දැන්වීමෙහි අන්තර්ගතව නොමැති නම් දැනට ඇති අදාළ ගම / වීථිය සමඟ වරහන් තුළ එම පාර / වීථිය යෙදීමට කටයුතු කරන්න.”** මෙහිදී ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාළ ප්‍රතිපාදන ද සැලකිල්ලට ගත යුතුය. **විශේෂයෙන්ම ඡන්ද බලය ජනතා පරමාධිපත්‍යය යටතට ගැනෙන බවත් ඡන්ද බලය ක්‍රියාත්මක කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනයේ නම ඇතුළත්ව තිබිය යුතු බව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාව පරිදි ඡන්ද හිමියකු වීමට නුසුදුසුකම් ද අනුව වේ.** විශේෂයෙන් ලියාපදිංචි වීමෙන් පුරවැසිභාවය ලබාගත් පුද්ගලයන්ගේ මෙන්ම පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත් අනුව පුරවැසිභාවය හිමිවන පුද්ගලයන් සම්බන්ධවද විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුය.

## 06. පුද්ගලයන්ගේ වයස

6.1 ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන්නේ ප්‍රතිශෝධන වර්ෂයේ ජූනි මස 01 වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වන පුද්ගලයන්ය. ඒ අනුව 2021 වසරේ ප්‍රතිශෝධනයේ දී 2021 ජූනි 01 වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වීම **සඳහා අදාළ පුද්ගලයින් 2003 මැයි මස 31 වන දින හෝ එයට පෙර උපන් අය විය යුතුය.** වයස සම්පූර්ණත්වය හේතුවෙන් (අනෙකුත් සුදුසුකම් ද සපුරා ඇති) අළුතින් මෙම වර්ෂයට ඡන්ද හිමියන් වශයෙන් ලියාපදිංචිය සඳහා යමෙකුගේ තොරතුරු ගෘහමූලිකයකු විසින් ඉදිරිපත් කර ඇත්නම් උප්පැන්න සහතිකය / ජාතික හැඳුනුම්පත පරීක්ෂා කිරීමෙන් ER ආකෘති පත්‍රයේ සඳහන් එබඳු උපන්දින සම්බන්ධව සැලකිල්ලට ගත යුතුය.

6.2 වයස අවුරුදු 18 සම්පූර්ණ වී වසර දෙක තුනක් යන තෙක් ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කර ගැනීමට නොහැකි වූ පුද්ගලයින්ගේ නම් මෙම ප්‍රතිශෝධනයේ දී පළමුවරට ඇතුළත් කරන විට ඒ බවට ගණන් ගන්නා නිලධාරි විසින් අදාළ ER ආකෘතියේ සටහනක් යෙදිය යුතුය.

## 07. පදිංචිය වෙනස් කිරීම නිසා යම්කිසි ස්ථානයක අළුතින් ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කරන තැනැත්තන්

ප්‍රවර්ථන නාමලේඛනයේ ලියාපදිංචි වී නොමැති යම් පවුලක් යම් ලිපිනයක් යටතේ අළුතින් ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඔවුන් එම ලිපිනයට, ජුනි මස 01 දින වනවිට පදිංචියට පැමිණ සිටිය යුතුය. තවද ඔවුන් ඊට පෙරාතුව ඡන්ද හිමියන් වශයෙන් ලියාපදිංචිව සිටි ස්ථානය හෝ පදිංචිව සිටි ස්ථානය පිළිබඳව කරුණු විමසා බැලීම ගණන් ගන්නා නිලධාරියාගේ වගකීමකි. අවසන්වරට ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි ලිපිනය ER ආකෘති පත්‍රයේ 5 වන තීරුවේ සඳහන් කළ යුතු වේ.

7.1 පූර්ව ලියාපදිංචිය පිළිබඳ විස්තර දැනුම්දීම සඳහා නිකුත් කරන ලිපියක් (ආදර්ශ ලිපි - 1) මඟින් අවසන් වරට ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි විස්තර ලිපියක් ලබා දෙන ලෙස ඡන්ද හිමියකු ඉල්ලා සිටින්නේ නම් එවැනි ලිපියක් නිකුත් කිරීමට ක්‍රියා කළ යුතුය. අළුතින් වසමට පදිංචියට පැමිණි පුද්ගලයකු එවැනි ලිපියක් ඉදිරිපත් කරන්නේ නම් එය භාරගෙන ER ආකෘතියට අමුණා මැතිවරණ කාර්යාලයට භාර දිය යුතුය. පෙර පදිංචියට අදාළ තොරතුරු නිසිපරිදි ලබාදී ඇත්නම් ලිපියක් අත්‍යාවශ්‍ය නොවන බව සලකන්න.

## 08. ක්ෂේත්‍ර සංගණනයේදී ප්‍රමාණවත් තොරතුරු සැපයීමට අපොහොසත් වූ තැනැත්තන් ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි කිරීම

දිගුකලක් අදාළ ලිපිනයේ සාමාන්‍ය පදිංචිව සිටියද පෙර පදිංචි විස්තර සනාථ කිරීමට තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම නිසා ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචියට බාධා පැමිණ ඇතිවිට ඔහු / ඇයගෙන් ලිඛිත ප්‍රකාශයක් ලබාගෙන හෝ ඔවුන් දිගු කලක් අදාළ ලිපිනයේ පදිංචිව සිටි බවට ගණන් ගන්නා නිලධාරි විසින් එම ගෘහයට අදාළ ER ආකෘතියේ සටහනක් සහිතව, අත්සන් තබා ඇතිනම්, එම ඡන්ද හිමියන්ගේ නම් පිළිගත හැකිය.

08.1 ජාතික හැඳුනුම්පත හෝ උප්පැන්න සහතිකය ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම මත වයස තීරණය කර ගැනීමේ ගැටළු, පුරවැසිභාවය තීරණය කිරීමට අදාළ ගැටළු නිසා ඡන්ද හිමියකු ලියාපදිංචියට බාධා පැමිණ ඇතිවිට අදාළ ආකෘතියේ වූ ප්‍රකාශයක් අනිවාර්යයෙන්ම ලබාගත යුතුය. ක්ෂේත්‍ර ගණන් ගැනීමේදී එම ප්‍රකාශ ලබාගෙන සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරි වෙත ඉදිරිපත් කිරීම හෝ එකී ප්‍රකාශයේ පිටපතක් ද සමඟ අභියාචනා කාල සීමාවේදි හිමිකම් ඉල්ලුම්පතක් ඉදිරිපත් කරන ලෙස ඡන්ද හිමියන් දැනුවත් කිරීමට ක්‍රියා කළ යුතුය.

## 09. සාමාන්‍ය පදිංචිය

### 09.1 අදාළ ගෘහයේ සාමාන්‍ය පදිංචියක් තිබීමේ අවශ්‍යතාව

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේදී පුද්ගලයින්ගේ නම්, පවුල් වශයෙන් ඔවුන් පදිංචි ලිපින යටතේ ලියාපදිංචි කළ යුතුය. යමෙකුගේ සාමාන්‍ය පදිංචි ලිපිනය හැටියට ඔහු / ඇය සිය පවුලේ සාමාජිකයන් සමඟ වාසය කරන හා සිය දෛනික සාමාන්‍ය කටයුතු ඉටු කරනු ලබන ස්ථානය පිළිගත හැකිය (පවුල් ඒකකයක් එක් ලිපිනයක ලියාපදිංචි කිරිමේ ප්‍රමුඛ කාරණයක් වන්නේ ද්විත්ව හා බහුලියාපදිංචි අවම කිරිමය. කිසියම් ඡන්ද හිමියෙකු සාමාන්‍ය පදිංචි ලිපිනයන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සත්‍ය වශයෙන්ම ඇත්නම් ඉන් එක් ලිපිනයක පවුල් ඒකකයෙන් බැහැරව ලියාපදිංචිවීම සඳහා නෛතික අයිතියක් ඇතිබව අවධානය යොමු කිරිමට කැමැත්තෙමි. හැකිතාත් දුරට පවුල් ඒකකය එක් ලිපිනයක ලියාපදිංචි කරවීම සඳහා උත්සහය ගතයුතුය). විශේෂයෙන් යමෙකු තමාට පැවරී ඇති රාජකාරි කටයුත්තක් නිසා සාමාන්‍ය පදිංචි ස්ථානයෙන් බැහැරව ගොස් ඇත්නම්, ඒ පිළිබඳව සැලකිල්ල යොමු කළ යුතු බව අදාළ පනතේ සඳහන් වේ. තවද, තාවකාලිකව යම්කිසි නිවසකට කුමන හෝ කාර්යයක් සඳහා පවුලේ සාමාජිකයෙකු නොවන අයෙකු පැමිණ සිටින්නේ නම්, එබඳු අයෙකුගේ නම්. ER ආකෘතිපත්‍රයට ගෘහ මූලිකයා විසින් ඇතුළත් නොකළ යුතුය. පනතේ 4(3) උප වගන්තියට යටත්ව පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන,

• වාසස්ථාන නොවන හෝ ගෘහයක් නොමැති කිසිදු ස්ථානයකට නම් ඇතුළත් නොකිරීම.

• ගෘහයක් තිබුණ ද, එහි අයිතිය තිබුණ ද සාමාන්‍ය පදිංචියක් නොමැති නම් ලියාපදිංචි නොකිරීම.

• ඉඩම් අයිතිය තහවුරු කර ගැනීම සඳහා පදිංචියක් නොමැතිව ඡන්දහිමි නාමලේඛනයට නම් ඇතුළත් කර ගැනීමට කටයුතු කරන අවස්ථාවල

• පාසල් වලට ළමුන් ඇතුළත් කර ගැනිම, විශ්ව විද්‍යාල ප්‍රවේශය හා රැකියා අවස්ථා සඳහා පදිංචිය සනාථ කිරීමට සහ දේශපාලනඥයින්ගේ අවශ්‍යතා මත සමහර ගෘහ වලට පදිංචියක් නොමැතිව නම් ඇතුළත් කර ගැනිමට උත්සාහ කිරීම වැනි අවස්ථාවල

ඒ සඳහා අවස්ථාව ලබා නොදී සාමාන්‍ය පදිංචිය ගැන අවධානය යොමු කොට තීරණ ගත යුතු ය.

## 09.2 සාමාන්‍ය පදිංචි ස්ථාන කිහිපයක් ඇති පුද්ගලයන්

සමහර අවස්ථා වලදී නිල නිවාසවල පදිංචි වී සිටින පවුල් ඒ යටතේ ලියාපදිංචි නොවී, ඔවුන්ට අයත් පෞද්ගලික නිවාස යටතේ ලියාපදිංචි වීමට ඉල්ලුම් කිරීමට පුළුවන. එබඳු අවස්ථා වලදී ඉදිරිපත් කරනු ලබන කරුණු නිවැරදි නම් එම ගෘහ මූලිකයාගේ කැමැත්තට ඉඩ දිය හැකිය. පනතේ 4(3) උප වගන්තිය කෙරෙහි අවධානය යොමු කරවමි.

*"යම් වර්ෂයක ජූනි මස පළමුවන දිනයේ දී තැනැත්තකුගේ පදිංචිය පිළිබඳ යම් ප්‍රශ්නයක් තීරණය කිරීමේ දී ප්‍රස්තුත ලිපිනයෙහි ඔහුගේ සිටිම හෝ නොසිටිම මෙන් ම ඔහුගේ සිටිම හෝ නොසිටිම හා සම්බන්ධ හේතුව සහ වෙනත් අවස්ථානුගත කරුණු පිළිබඳව ද, විශේෂයෙන් ම ඔහු විසින් දරනු ලබන හෝ භාර ගන්නා ලද හෝ යම් ධූරයකින්, සේවයකින් නැතහොත් සේවා නියුක්තියකින් උද්ගතවන හෝ ඒ ධූරයට, සේවයට නැතහොත් සේවා නියුක්තියට ආනුෂංගික වන හෝ යම් කාර්යයක් ඉටුකිරීමෙහි ලා ඒ ලිපිනයෙහි ඔහුගේ නො සිටීම පිළිබඳව ද විශේෂ සැලකිල්ල දැක්විය යුතු ය."*

## 09.3 ව්‍යාපාරික ස්ථාන යටතේ පදිංචිව සිටින තැනැත්තන්

සමහර පුරවැසියන් තමාට අයත් ව්‍යාපාරික ස්ථාන යටතේ ඡන්ද හිමියන් වශයෙන් ලියාපදිංචි වීමට ඉල්ලා සිටින අවස්ථා ඇත. එබඳු අවස්ථා වලදී එම පවුලේ සාමාජිකයින් එම ස්ථානයේ සැබෑලෙසම පදිංචිව සිටීද යන්න පිළිබඳව කරුණු සොයා බැලිය යුතුය. එවැනි තැනැත්තන් එම ස්ථානයේ පදිංචිව සිටින්නේ නම් ලියාපදිංචිය සඳහා ඉඩ දිය හැකිය. එහෙත් ඔවුන්ගේ වෙනත් සාමාන්‍ය පදිංචි ලිපිනයක් තිබේ නම් ඒ පිළිබඳව කරුණු සොයාබැලීමට හැකිවන පරිදි එම විස්තර ගණන් ගන්නා නිලධාරි විසින් සටහන් කරගත යුතුවේ.

## 09.4 වැඩිහිටි නිවාස

රජයේ හා පෞද්ගලික ආයතන මඟින් පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස යටතේ ඒවායේ නේවාසිකව පදිංචි වී සිටින අයගේ නම් අදාළ ස්ථාන භාරකරුවන් විසින් ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලබන අවස්ථා ඇත. එබඳු අවස්ථා වලදී අදාළ පුද්ගලයන්ට අයත් පූර්ව ලියාපදිංචි විස්තර සටහන් කර ගැනීම අවශ්‍ය වේ. සුදුසුකම් සපුරාලන්නේ නම් එබඳු අයගේ නම් එවැනි ස්ථාන යටතේ ලියාපදිංචි කළ හැකිය.

## 10. ප්‍රවර්තන ඡන්දහිමි නාමලේඛනයේ සඳහන් ඡන්දහිමියන්ගේ නම්, ජාතික හැඳුනුම්පත් අංක හා වෙනත් තොරතුරුවල නිරවද්‍යතාව

10.1 ගෘහමූලිකයා විසින් සම්පූර්ණ කර ඇති ER ආකෘතිපත්වල සඳහන් පුද්ගලයන්ගේ නම් සහ ජාතික හැඳුනම්පත් අංක, නිවැරදිව ඇතුළත් කර ඇත්දැයි ER ආකෘතිපත් එකතු කරන අවස්ථාවේදී ගණන් ගන්නා නිලධාරියා විසින් පරීක්ෂා කර බැලිය යුතුය. හැකිතාක් දුරට එබඳු අවස්ථා වලදී එම විස්තරවල නිවැරදිතාව අදාළ ජාතික හැඳුනුම්පත් පරීක්ෂා කිරීමෙන්ම තහවුරු කර ගැනීම අවශ්‍ය වේ.

10.2 ඡන්දහිමියන් ගණන් ගන්නා අවස්ථාවේදී යම් ඡන්දහිමියෙකුගේ නමක, ජාතික හැඳුනුම්පත් අංකයක, ගෘහ අංක හෝ ස්ත්‍රී පුරුෂභාවයට අදාළව ප්‍රවර්තන නාමලේඛනයෙහි වැරදි අන්දමින් තොරතුරු සටහන් වී ඇත්නම් ඒවා නිවැරදි විය යුතු ආකාරය ආකෘති අංක 7න් ගණන් ගන්නා නිලධාරීන්ගෙන් ලබා ගත යුතුය.

10.3 පුද්ගලයකුගේ ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදි බව සනාථකර ගැනීම සඳහා හැඳුනුම්පතේ ඡායා පිටපතක් අවශ්‍ය නොවන අතර අංකය නිවැරදි බවට වූ ග්‍රාම නිලධාරි සටහන සහිතව ග්‍රාම නිලධාරි විසින් අත්සන් කර ඇත්නම් එය ප්‍රමාණවත් වේ.

## 11. විදේශගත ඡන්දහිමියන්

තාවකාලිකව රැකියා කටයුතු හෝ අධ්‍යාපන කටයුතු හෝ වෙනුවෙන් විදේශගත වී සිටින මෙබඳු අයට අදාළ විස්තර ඔවුන්ගේ මෙරට සාමාන්‍ය පදිංචි ලිපිනය යටතේ ගෘහ මූලිකයකු විසින් ඉදිරිපත් කරනු ලබන්නේ නම් හා එම අදාළ කරුණු නිවැරදි නම් සුදුසුකම් ඇති එබඳු පුද්ගලයන්, ඔවුන්ගේ මෙරට සාමාන්‍ය පදිංචි ලිපිනය යටතේ ලියාපදිංචි කිරීම සඳහා නිර්දේශ කළ හැකිය.

## 12. ග්‍රාම නිලධාරි වසම් තුළ පදිංචි වැදගත් පුද්ගලයින්ගේ නම් ගණන් ගැනීම

වසම් තුළ පදිංචි වත්මන්/හිටපු පාර්ලිමේන්තු හා හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා නියෝජිතයන් මෙන්ම අදාළ ඡන්ද විමසීම් වලදී තරඟ කරන ලද අපේක්ෂකයන්ගේ නම් ද ඇතුළුව අනිකුත් ප්‍රමුඛ පුරවැසියන්ගේ (විහාරාධිපති හිමිවරුන් ඇතුළු පූජ්‍ය / පූජක උතුමන් වහන්සේ, අධිකරණ සේවයේ විනිශ්චයකරුවන්, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්, ප්‍රදේශයේ සමිති සමාගම්වල නිලධාරීන්) නම් ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් වී තිබේද යන්න සම්බන්ධයෙන් නිසැක විය යුතුය. එවැනි විශේෂිත යම් අයෙකුගේ නම ඇතුළත් කිරීමට නොහැකි තත්ත්වයක් මතුව ඇත්නම් හෝ තොරතුරු ලබාගත නොහැකි නම් හෝ ප්‍රතිශෝධන ලේඛන ආපසු මැතිවරණ කාර්යාලයට භාරදීමට පැමිණි පසු දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් වෙත ලිඛිතව එවැනි තොරතුරු ලබා දිය යුතුය. තොරතුරු ඇතුළත් ආකෘති අංක 6ට අදාළ වාර්තාව සකස් කිරීමටද ක්‍රියා කරන්න.

## 13. පසුගිය ප්‍රතිශෝධනයේදි ස්වකීය නම් ලියාපදිංචි නොවූ බවට ඉදිරිපත් වූ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම

2020 ඡන්දහිමි නාමලේඛනයේ නම් ඇතුළත් නොවීම සම්බන්ධයෙන් පැමිණිලි කළ සියලුම තැනැත්තන් පිළිබඳ තොරතුරු ගණන් ගැනීමේ නිලධාරීන්ට දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට ලබා දිය යුතු අතර එම පුද්ගලයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට ක්‍රියා කළ යුතුය.

## 14. රාජ්‍ය ආයතනවලින් තොරතුරු ලබාගැනීම.

14.1 ඡන්දහිමියන් ගණන් ගැනීමට අදාලව පහත සඳහන් ආයතනවලින් මතු සඳහන් තොරතුරු ලබාගැනීමට මූලික සාකච්ඡා පවත්වා ඇති අතර එම තොරතුරු කඩිනමින් ලබා ගැනීම අපේක්ෂා කරමි.

14.1.1.පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් වයස අවුරුදු 18 සම්පූර්ණ තැනැත්තන්ගේ විස්තර ලබාගැනීම.

14.1.2. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් මරණයට පත්වූ තැනැත්තන්ගේ විස්තර ලබාගැනීම.

14.1.3. පළාත් පාලන ආයතනවලින් මරණයට පත්වූ තැනැත්තන්ගේ විස්තර ලබාගැනීම.

14.2 ඊට අමතරව පාසල් මඟින්, විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින්, ආගමන විගමන දෙපාර්තමේන්තුව මඟින්, සේවක අර්ථ සාධක අරමුදල මඟින් තොරතුරු ලබාගැනීමට ඉදිරියේදී සාකච්ඡා පැවැත්වීමට නියමිත වේ.

14.3 මෙමගින් අපේක්ෂා කරනුයේ එම ආයතනවල ඇති දත්ත ආශ්‍රයෙන් ලියාපදිංචි නොවූ ඡන්දහිමියන්ගේ තොරතුරු ගණන් ගැනීමේ නිලධාරීන් වෙත ඉදිරියේදී ලබා දෙන අතර, ඒ පිළිබඳව ඔබගේ අවධානය යොමු කොට ER ආකෘති සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය උපදෙස් ඉදිරියේදී ඔබ වෙත ලබා දෙනු ඇත.

15. ඉහත සෑම මූලාශ්‍රයකින්ම ලැබෙන දත්ත ආශ්‍රයෙන් ER ආකෘති සම්පූර්ණ කර ගැනීමත් 2021.06.21 දින සිට 2021.07.21 අතර කාලය තුල අදාල පිටපත් හා ලියාපදිංචිය ඉල්ලා ඇති තැනැත්තන් සඳහා නිර්දේශ සටහන් කිරීම සිදුකළ යුතුවේ. සෑම ඉවත්වන නමක් සහ ඇතුලත්වන නමක් සම්බන්ධයෙන් ගණන් ගන්නා නිලධාරී නිවසට ගොස් පරීක්ෂා කර ඔබගේ නිර්දේශය ලබාදීම අනිවාර්ය වේ.

**A, B ලැයිස්තු සකස් කිරීම පළවන අදියර A, B කෙටුම්පත සකස් කිරීම.**

16. මෙම වර්ෂයේ දී A, B ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම අදියර දෙකකින් සිදු කරනු ලබයි. මූලික අවස්ථාවේ දී A, B ලැයිස්තුවල කෙටුම්පතක් ප්‍රදර්ශනය කිරීම 2021.08.16 සිට 2021.08.27 දින දක්වා සිදු කරනු ලබයි.

17. මෙම පළමු අදියර අදාළව ගණන් ගැනීමේ නිලධාරීන්ට ලැබී ඇති ER ආකෘතිවල A ලැයිස්තුවට නිර්දේශ කරනු ලබන නම් ER/DR-A ආකෘතිය මඟින් ද B ලැයිස්තුව නිර්දේශ කරන නම් ER/DR-B ආකෘතිය මඟින්ද ලබා ගත යුතු අතර ගණන් ගැනීමේ නිලධාරී වෙත ER ආකෘතියෙන් ලියාපදිංචිය සඳහා ගෘහ මූලික ඉල්ලා ඇතත් නිර්දේශ කරනු නොලබන නම් ER/DR-C ආකෘතියෙන්ද වසමට අදාල සාරාංශය ER - SM ආකෘතියෙන්ද ලබා දිය යුතුය. මෙම ගණන් ගැනීමේ නිලධාරීගේ ගණන් ගැනීමේ ලේඛන හා A, B ලැයිස්තුවල පිටපත් 2021.07.26 සිට 2021.07.30 දක්වා කාලය තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලදී ඡන්ද ප්‍රදේශ භාර නිලධාරීන් විසින් භාර ගැනීම සිදු කරනු ලබයි.

**A, B ලැයිස්තු සකස් කිරීම දෙවන අදියර අවසන් විධිමත් A, B ලැයිස්තුව සකස් කිරීම.**

18. 2021.08.16 සිට 2021.08.27 දක්වා A කෙටුම්පත හා B කෙටුම්පත ප්‍රදර්ශනය කෙරේ. තවදුරටත් සංශෝධන අවශ්‍ය තැනැත්තන් සඳහා ER හෝ UE ආකෘතිය මඟින් ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබාදෙනු ඇත. ඒ අනුව දෙවන අදියර ලෙස A, B ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම 2021.09.14 දින සිට 2021.10.11 දින දක්වා සිදු කරනු ලබයි.

19. මෙම දෙවන අදියරට අදාළව ගණන් ගැනීමේ නිලධාරීන් වෙත ලැබී ඇති ලේඛන (ER සහ UE ආකෘති) හා පහත සඳහන් ආකෘතිද සම්පූර්ණ කර 2021.09.03 සිට 2021.09.07 දක්වා අතර තුර ලබා දිය යුතුය.

- අ / A ආකෘතිය
- ආ / B ආකෘතිය
- "අ" සහ "ආ" නම් පිළිබඳ සංශෝධන
- ආකෘති අංක 1 – 9 දක්වා

20. ගණන් ගැනීමේ ආකෘති ආපසු බාරගැනීමේ වැඩසටහන පිළිබඳව අදාල ප්‍රාදේශීය ලේකම්වරුද දැනුම්වත් කිරීම සිදු කරන අතර, එම ලේඛන භාරදීම, අවසරයකින් තොරව ප්‍රමාද කරන නිලධාරීන් හා ප්‍රතිශෝධන ලේඛන මැතිවරණ කාර්යාලයට භාරදීම පමා කිරීම හේතුවෙන් වසමකට අයත් “අ” සහ “ආ” ලැයිස්තු නියමිත දිනට ප්‍රදර්ශනය කිරිමට නොහැකි වුවහොත් එබඳු නිලධාරීන්ට ද විරුද්ධව විනයානුකූලව ක්‍රියාකරනු ඇත.

21. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයේදී ගණන් ගැනීමේ නිලධාරී ලෙස රාජකාරී ඉටු කරනු ලබන ග්‍රාම නිලධාරීන්ගේ සේවය මැතිවරණ කොමිෂන් සභාව ඉතා අගය කොට සලකනු ලැබේ.

# ස්තූතියි!